**23-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, නිහඬව සිටීම උතුම් ගුණධර්මයකි. නිහඬව සිට නිතරම පරමාත්ම පියාව සිහි කළ විට ඔබට විශාල ආදායමක් උපයා ගත හැකි වේ.

**ප්‍රශ්නය:** ඔබ විසින් නොකිය යුතු කර්ම අත්හැරීම යන්න කියැවෙන වචන මොනවාද?

**පිළිතුර:** නාටකයේ තිබෙනවා නම් මම එය කරන්නම් බාබා කියන්නේ: මෙය කර්ම අත්හැරීමක් වගේයි. ඔබ අනිවාර්යෙන්ම ක්‍රියා කළ යුතුයි. උත්සාහයකින් තොරව ඔබට වතුර වීදුරුවක්වත් ලඟට ගන්න බැහැ. එමනිසා, නාටකයේ තිබෙනවා නම් කියා කිසිවක් නොකර ඉඳීම කිසිවිටෙක නොකරන්න. නව රාජ්‍යයේ උසස් තත්ත්වයක් දිනා ගැනීමට අවශ්‍ය නම් කියා කිසිවක් නොකර ඉඳීම කිසිවිටෙක නොකරන්න. නව රාජ්‍යයේ උසස් තත්ත්වයක් දිනා ගැනීමට අවශ්‍ය නම් දැඩි උත්සාහයක් දැරිය යුතුයි.

ඕම් ශාන්ති. පළමුවෙන්ම ඔය දරුවන්ට අනතුරු අඟවා තිබෙනවා: පරමාත්ම පියාව සිහි කරන්න. ඔබගේ උරුමය සිහි කරන්න. මන්මනාභව. මෙසේ ලිව්වේ ව්‍යාස්ය. පරමාත්ම පියා සංස්කෘත බසින් පැහැදිලි කළේ නැහැ. පියා පැහැදිලි කරන්නේ හින්දි බසින්. ඔහු දරුවන්ට කියන්නේ: පරමාත්ම පියාවත් ඔබගේ උරුමයත් සිහිකරන්න. මෙය ඉතාමත් පහසු ප්‍රකාශයක්: දරුවනි, ඔබගේ පියා වන මා සිහි කරන්න. භෞතික පියෙක්, දරුවනි ඔබගේ පියා වන මාව සිහි කරන්නයි කියා කියන්නේ නැහැ. මෙය අලුත් දෙයක්. පරමාත්ම පියා කියනවා: අහෝ දරුවනි, මා ඔබගේ අශාරීරික පියායි. මාව සිහි කරන්න. ආධ්‍යාත්මික පියා ඔය ආධ්‍යාත්මිකයන්ට කතා කරනා බව ඔය දරුවන්ට තේරෙනවා. තම ආධ්‍යාත්මික පියාව සිහි කිරීම තම වගකීමක් බව දරුවන් තේරුම් ගන්නා නිසා පියාව සිහි කරන්නැයි කියා දරුවන්ට නැවත නැවතත් කීම නිවැරදි දෙයක් වන්නේ නැහැ. ඔය දරුවන් නිරන්තර ස්මරණයේ සිටීමට උත්සාහ දැරිය යුතුයි. මේ කාලයේ දී කිසිම කෙනෙකුට අඛණ්ඩව ස්මරණයේ සිටිය නොහැකියි: එයට කාලයක් ගත වෙනවා. මේ බාබා පවා කියන්නේ: මටත් නිතරම ස්මරණයේ සිටින්න බැහැ. එම තත්ත්වය ඇති වන්නේ අවසානයටයි. ඔය දරුවන් විසින් දැරිය යුතු පළමුවනම උත්සාහය නම් පියා සිහි කිරීමට උත්සාහ දැරීමයි. උරුමය ලැබෙන්නේ ශිව බාබාගෙනුයි. මෙය අදාල වන්නේ භාරත ජනතාවටයි. දේවතා රාජ්‍යයේ ස්ථාපනය සිදු වෙමින් පවතිනවා. අනිකුත් ආගම් ස්ථාපනය කිරීමේ අපහසුතාවයක් නැහැ: ඒ සෑම කෙනෙක්ම තම තමන්ගේ නියමුවන් සමඟ පහළට පැමිණෙනවා. දේවතා ධර්මයට අයිති අයව ඥානයෙන් ඉහළට ගත යුතුයි. මෙයට උත්සාහයක් දැරිය යුතුයි. රාජ්‍යයක් ස්ථාපනය කිරීම සඳහා සංගම යුගයේදී පරමාත්ම පියා පැමිණෙනවායි කියා ගීතාවේ සඳහන් කර නැහැ. ගීතාවේ ලියා ඇත්තේ පාන්දවයින් කන්දට ගිය වේලාවේ විනාශය සිදු වුණු බවයි. ඇත්තටම කියනවා නම් එය එසේ නොවෙයි. ඔබ දැන් ඔබගේ අනාගත උපත් 21 සඳහා ඉගෙන ගන්නවා. අන් පාසල් වලදී ඔබට උගන්වන්නේ දැන් මේ කාලය සඳහායි. සන්යාසීන් හා පූජකවරුන් උගන්වන්නේ අනාගතය සඳහායි. මන්ද තමන් ශරීර අතහැර දමා මුක්ති දේශයට ගොස් බ්‍රහ්ම ලෝකය හා එක් වෙනවායි කියා ඔවුන් විශ්වාස කරනවා. ජීවාත්මය පරමාත්ම ජීවය හා එක් වෙනවා. එමනිසා, එයත් අනාගතය වෙනුවෙනුයි. කෙසේවෙතත්, අනාගතය සඳහා උගන්වන්නේ වෙන කිසිවෙක් නොව ආධ්‍යාත්මික පියාම පමණයි. සෑමට විමුක්තිය දානය කරන්නා එකම එක් අයෙක් බව සඳහන් කර තිබෙනවා. ඒ සෑම කෙනෙක්ම වැරදියි. පරමාත්ම පියා පමණයි පැමිණ මෙය පැහැදිලි කරන්නේ. මිනිසුන් දිගටම ආධ්‍යාත්මික උත්සාහයන් දරනවා. බ්‍රහ්ම ලෝකය හා මුසු වීම සඳහා ඔවුන් දරණ උත්සාහය වැරදියි. කිසිම කෙනෙක් එසේ වන්නේ නැත. බ්‍රහ්ම ලෝකය දෙවියන් නොවෙයි. ඒ සියල්ල වැරදියි. මිත්‍යා දේශයේ සිටිනා සෑම කෙනෙක්ම කියන්නේ බොරුයි. සත්‍ය දේශයේ සිටිනා සෑම කෙනෙක්ම කියන්නේ සත්‍යයයි. භාරතය පුරා සත්‍යයේ දේශය තිබුණු බව ඔබ දන්නවා. දැන් මෙය මිත්‍යා දේශයයි. පරමාත්ම පියා පැමිණෙන්නේ භාරතයට පමණයි. මිනිස්සු ශිවාගේ ජන්ම දිනයත් සමරණවා. නමුත් ශිවා පැමිණ සත්‍ය දේශය ස්ථාපනය කළ බව ඔවුන් දන්නේ නැහැ. ඔහු පැමිණෙන්නේ නැහැ. ඔහුට නමක් රූපයක් නැහැයි කියා තමයි ඔවුන් විශ්වාස කරන්නේ. ඔවුන් ගයනා ගීතය නම් ඔහු පාරිශුද්ධකරු හා ඥාන සාගරය කියලයි. ඔවුන් ගිරවුන් සේ එසේ ගායනා කරනවා. පරමාත්ම පියා පමණයි පැමිණ මෙය ඔබට පහදා දෙන්නේ. මිනිස්සු ක්‍රිෂ්ණාගේ ජන්ම දිනය සමරනවා. ගීතාවේ ජන්මයත් සමරණවා. ක්‍රිෂ්ණා පැමිණ ගීතාව කිව්වා කියා තමයි ඔවුන් කියන්නේ. කිසිම කෙනෙක් ශිවාගේ ජන්මය ගැනවත් ඔහු පැමිණ කලේ මොනවාද කියාත් දන්නේ නැහැ. ඔහුට නමක් රූපයක් නැහැයි කියා කියනවා නම්

කොහොමද පැමිණෙන්නේ? පරමාත්ම පියා කියනවා: මා මෙහි පැමිණ ඔය දරුවන්ට පහදා කියනවා. පසුව මෙම ඥානය අතුරුදහන් වෙනවා. පරමාත්ම පියාම පහදා කියනවා: මා පැමිණ නැවතත් වතාවක් භාරතය දෙව්ලොව කරනවා. පාරිශුද්ධකරු වන කෙනෙක් සිටි යුතුයි. ප්‍රධානම දෙය භාරතය ගැනයි. අපිරිසිඳු වී ඇත්තේ භාරතයයි. පාරිශුද්ධ කරුවාණන්ට කන්නලව් කරන්නේ භාරත ජනතාව පමණයි. මෙම ලෝකය යක්ෂයින්ගේ රාජ්‍යයක් කියා මිනිසුන්ම කියනවා. බෝම්බ සාදමින් සිටිනවා. ඒවා මගින් විනාශය සිදු වේවි. ඔවුන් සූදානම් වන්නේ ඒ සඳහායි. රාවණ ඔවුන්ව ඒ සඳහා දිරිමත් කරනව වගේයි. රාවණ රාජ්‍යය අවසන් වන්නේ කවදාද? භාරත ජනතාව කියනවා: ක්‍රිෂ්ණා පැමිණි විටයි කියලා. ශිව බාබා පැමිණ සිටිනවා කියා ඔබ කියනවා. ඔහු සැමට විමුක්තිය දානය කරන්නායි පරමාත් පියා කියනවා: මා සිහිපත් කරන්න. වෙන කිසිම කෙනෙකුට මෙසේ කියන්න බැහැ. පරමාත්ම පියා පමණයි කියන්නේ: මා සිහි කරන්න. බැඳී ඇති මළකඩ ඉවත් වේවි. ඔය ජීවාත්මයන් සතෝප්‍රධාන්ව සිටියා නමුත් දැන් ඔබලා මත කහට බැඳිලා. ඒ කහට ඉවත් කල හැක්කේ ස්මරණයෙන් පමණයි. මෙය හඳුන්වන්නේ ස්මරණ වන්දනාව කිලයි. පාරිශුද්ධකරු වන්නේ මා පමණයි. මා සිහි කිරීමෙන් ඔබගේ පාප දුරුවේ. යෝග අග්නිය කියන්නේ මෙයයි. බැඳී ඇති කහට ඉවත් කිරීම සඳහා රත්තරන් ගින්නට දමනවා. අනිකුත් ලෝහ මිශ්‍ර කිරීමටත් එය ගින්දරට දමනවා. පරමාත්ම පියා කියනවා: ඒ රාග ගින්නයි. ඥාන ගින්නත් තිබෙනවා. මෙම යෝග ගින්නෙන් ලෝහ කිලිටි ඉවත් වී ක්‍රිෂ්ණ දේශයට යාමට සුදුසු කෙනෙක් බවට ඔබ පත් වෙනවා. ක්‍රිෂ්ණ ජයන්තියේදී මිනිස්සු ක්‍රිෂ්ණාව කැඳවනවා. ක්‍රිෂ්ණා තම උරුමය දිනා ගන්නේ පරමාත්ම පියාගෙන් කියා ඔබ දන්නවා. ක්‍රිෂ්ණා දෙව්ලොව පාලකයායි. ක්‍රිෂ්ණාට ඒ තත්ත්වය දෙන්නේ පරමාත්ම පියායි. රාධේ හා ක්‍රිෂ්ණා පසුව ලක්ෂ්මී හා නාරායන වෙනවා. මිනිස්සු රාධේ හා ක්‍රිෂ්ණාගේ ජන්ම දින සමරනවා. ලක්ෂ්මී හා නාරායන ගැන කිසිම කෙනෙක් කිසිම දෙයක් දන්නේ නැහැ: ඔවුන් මුලුමනින්ම පටලැවිල්ලට පත් වෙලා. ඔය දරුවන්ට දැන් මෙය තේරෙන නිසා ඔබ එය අන් අයටත් පැහැදිලි කර කියා දිය යුතුයි. පළමුවෙන්ම ඔවුන්ගෙන් අහන්න: ගීතාවේ කියනවා: නිරතුරුව මා පමණක් සිහිපත් කරන්න කියලා එසේ කිවේ කවුද? ක්‍රිෂ්ණා කිව්වා කියා ඔවුන් විශ්වාස කරනවා. පරමාත්ම දෙවියන් අශාරීරික බවත් ඉහළම ඉහළ උසස් උපදෙස් ඔබ ලබන්නේ ඔහුගෙන් බවත් ඔබලා දන්නවා. පරමාත්ම පියා වන පරමාත්ම ජීවය පමණයි ඉහළම කෙනා වන්නේ. ඔහුගේ උපදෙස් අනිවාර්යෙන්ම උසස්ම උසස් උපදෙස් වෙනවා. සැම කෙනෙකුටම විමුක්තිය ලැබෙන්නේ ඒ එකම කෙනාගේ ශ්‍රීමත් මගිනි. බ්‍රහ්මා, විෂ්ණු හෝ ශංකර්වත් ගීතාවේ දෙවියන් වෙන්න බැහැ. ශ්‍රී ක්‍රිෂ්ණා යන ශාරීරික කෙනාට ගීතාවේ දෙවියන් කියා මිනිස්සු කියනවා. කොතැනක හෝ වැරදීමක් සිදු වී තිබෙන බව මෙයින් අනිවාර්යෙන්ම පෙන්නුම් වෙනවා. මෙය මිනිසුන් විසින් කළ ලොකු වරදක් බව ඔබට තේරෙනවා. රාජයෝගාව උගන්වන්නේ පරමාත්ම පියාම පමණයි. පාරිශුද්ධකරු වන්නේ ඔහුම පමණයි. ඔවුන් විසින් කර ඇති ලොකුම වැරැද්ද පෙන්වා පැහැදිලි කර දෙන්න. පළමුවනම වැරැද්ද දෙවියන් සැම තැනකම සිටිනවායි කීමයි. දෙවැන්න ගීතාවේ දෙවියන් ක්‍රිෂ්ණායි කියා කීමයි. ඊලඟ වැරැද්ද නම් කල්පයේ කාල පරාසය වසර සිය දහස් ගණනක් කියා කීමයි. මේවා ලොකු ලොකු වැරදියි. චක්‍රය වසර සිය දහස් ගණනක් වෙන්න බැහැ. දෙවියන් සැම තැනකම සිටිනවා වෙන්න බැහැ. ඔහු සියල්ලම කරවීමට සලස්වනවා කියා මිනිස්සු කියනවා. නමුත් එසේ විය නොහැකියි. ඔහු දිව්‍යඥාන සිතිවිල්ලෙන් ඔබව පාරිශුද්ධ කරවන්නේ නැහැ. පරමාත්ම පියා ඔබ ඉදිරියේම අසුන් ගෙන ඔබට: නිරතුරුවම මා පමණක්ම සිහි කරන්නයි කියා කියනවා. දිරිමත් කිරීම යන වචනය වැරදියි. ශංකර්ගේ දිරිමත් කිරීමෙන් මිනිස්සු බෝම්බ ආදිය හදනවායි කියා කීවත් ඒ සියල්ල නාටකයේ නියමිත වී ඇති දේවලුයි. විනාශයේ ගිණි දැල් මතු වන්නේ මෙම යාග ගින්නෙනි. ඔහු කිසිම කෙනෙක්ව එසේ දිරිමත් කරවන්නේ නැහැ. ඒ සැම කෙනෙක්ම විනාශය සඳහා උපකරණ වී සිටින්නන්ය. එය නාටකයේ තීරණය වී ඇති දෙයකි. ඒ මුලු චරිතයම ශිව බාබාගේයි. පසුව බ්‍රහ්ම, විෂ්ණු හා ශංකර්ගේ චරිත තිබෙනවා. බ්‍රහ්මා ඔය බ්‍රහමින්වරුන්ව නිර්මාණය කරනා අතර පසුව ඔබලා විෂ්ණු දේශයේ පාලකවරුන් වෙනවා. ඉන් අනතුරුව උපත් 84 ගිහින් පැමිණීමෙන් පසුව ඔබ බ්‍රහ්මාගේ පවුලේ කෙනෙක් වෙනවා. ලක්ෂ්මී හා නාරායන සරස්වතී හා බ්‍රහ්මා වෙනවා.ඔහු මොහු හරහා ඔබව භාර ගන්නා බව ඉන් අදහස් වෙනවා. ඒ විදියට තමයි ඔහු ජොෂ්ය මමා වෙන්නේ. ඒ මමා පසුව උපකරණයක් වෙනවා. කළස දී ඇත්තේ මව්වරුන්ටයි. ලොකුම සිතාරය දී ඇත්තේ සරස්වතීටයි. ඇය තමයි සැමටම වඩා දක්ෂ. කෙසේවෙතත් සිතාරයක් හෝ හාර්මෝනියක් ඇත්තේ නැහැ. සරස්වතීගේ ඥාන මුරලිය ඉතාමත් හොඳයි. ඇයව ඉහළින් වර්ණනාවට ලක්වී තිබෙනවා. මිනිසුන් ඇයට නම් රැසක් දී තිබෙනවා. දෙවහනන්ව වන්දනාවට ලක් වෙනවා. ඔබ මෙහිදී වන්දනීය අය බවට පත් වී පසුව වන්දනාකරුවන් වී තමන්වම වන්දනා කර ගන්නා බව ඔබලාට දැන් තේරෙනවා. දැන් අපි බ්‍රහමින්වරුන් පසුව අව වන්දනීය දේවතාවරුන් වෙනවා. රජ හා රැජිණ කොයි වගේද පුරවැසියනුත් එලෙසම

වේ. උසස් තත්ත්වයක් දිනා ගන්නා දෙවඟනන් වෙනුවෙන් දේවාල ගනාවක් සාදා තිබෙනවා. හොඳින් ඉගෙන ගෙන අන් අයටත් උගන්වනා අයගේ නම් කීර්තියට ලක්වෙනවා. වන්දනීය මෙන්ම වන්දනා කරන තත්ත්වයන්ට පත් වන්නේ තමන්ම බව ඔබට දැන් තේරෙනවා. ශිව බාබා සදාකාලයටම වන්දනීය වන්නා වේ. සූර්ය වාංශික දේවතාවරුන් වන්දනාකරුවන් වී බැතිමතුන් වෙනවා. වන්දනාවට සුදුසු අයගේ ඉහළට යන ගමන ඉතාමත් පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. පින්තූර භාවිත නොකර වුවත් ඔබට පහදා දිය හැකියි. මෙය මෙහිදී ඉගෙන ගන්නා අයගේ බුද්ධියේ මුලු ඥාන සම්භාරයම තැන්පත් වෙනවා. භාරතීය ජනතාව උපත් 84 ඉණිමගේ ඉහළ පහළ යනවා: ඔවුන් උපත් 84 ක් ගන්නවා. වන්දනීයව සිටි අපි දැන් වන්දනාකරුවන් වෙලා. හම් සෝ. සෝ හම් යන්නෙහි අරුත දැන් ඔබ හොඳින්ම දන්නවා. ජීවාත්මයකට පරමාත්ම ජීවය වෙන්න බැහැ. පරමාත්ම පියා ඔබට හම් සෝ, සෝ හම් යන්නෙහි අරුත පහදා දී තිබෙනවා. අපි දේවතාවරුන් ලෙසින් සිටියා දැන් ක්ෂත්‍රියයින් වෙලා. හම් සෝ යන්නට වෙන අරුතක් නැහැ. වන්දනීය සේම වන්දනා කරන තත්ත්වයට පත් වන්නේ භාරත ජනතාවමයි. වෙන කිසිම ආගමක කෙනෙක් වන්දනීය හෝ වන්දනා කර තත්ත්වයන්ට පත් වන්නේ නැහැ. ඔබලා සූර්ය වංශයේ හා චන්ද්‍ර වංශයේ අය බවට පත් වෙනවා. ඔබලා සූර්ය වංශයේ හා චන්ද්‍ර වංශයේ අය බවට පත් වෙනවා. ඔබලාට හොඳින් සියල්ල පැහැදිලි කර දී තිබෙනවා. අප දේවතාවරුන්ව සිටියා. ජීවාත්මයන් වන අප නිර්වාණ දේශයේ සිටියා. මෙම චක්‍රය කරකැවෙමින් යනවා. දුක ඔබ ඉදිරියේ පෙනී සිටිනා විටයි ඔබට පරමාත්ම පියාව සිහි වන්නේ පරමාත්ම පියා කියනවා: දුක ඇති කළ මා පැමිණ මෙම ලෝකය පරිවර්තනය කරනවා. මම නව ලෝකයක් නිර්මාණය කරනවා නොවෙයි. නැහැ: මා පැමිණ පැරණි ලෝකය අලුත් කරවනවා. පරමාත්ම පියා පැමිණෙන්නේ සංගම යුගයේදීයි. නව ලෝකය දැන් නිර්මාණය වෙමින් පවතිනවා. පැරණි ලෝකය දැන් අවසන් වේගෙනයි යන්නේ. මෙය අසීමිතත්වය පිළිබඳ කරුණක්. ඔබ සූදානම් වුණු විට මුලු රාජධානිය සූදානම් වේවි. ඔබ එකිනෙකා කුමන තත්ත්වයකට පත් වූවත් සෑම කල්පයකදීම ඔබ නොනවත්වාම දරන්නේ ඒ මත පදනම් වුණු උත්සාහයකි. නාටකයේ නියමිත ඕනෑම උත්සාහයක් තමන් දිගටම කරගෙන යනවා කියා සිටිය යුතු නැත. ඔබ උත්සාහ දැරිය යුතුයි. එවිට ඒ දරණා උත්සාහය මීට පෙර කල්පයේද ඔබ විසින් දරා ඇතැයි කියා කිව හැකියි. උත්සාහයට සෑම විට වැඩි වැදගත්කමක් දෙනවා. ප්‍රතිලාභය දෙස පමණක් බලාගෙන සිටින්න එපා. උත්සාහයකින් තොරව ලාභයක් ලබා ගත නොහැකියි. උත්සාහයකින් තොරව වතුර වීදුරුවක්වත් බොන්න බැහැ. කර්ම අත්හැරීම යන්න වැරදියි. පරමාත්ම පියා කියනවා: ඔබගේ පවුලේ අයත් සමඟ නිවසේ ජීවත් විය හැකියි. බාබා කිසිම කෙනෙකුට මෙහි නතර වීමට ඉඩ දෙන්නේ නැහැ. ඔහු හා සරණ යාම කියා කියනවා. බතී වැඩසටහනක් නිර්මාණය කිරීමට සිදු වූයේ ඔවුන් තාඩන පීඩන වලට ලක් වුණු නිසයි. එමනිසා, ඔවුන් පියාගේ රැකවරණය පතා පැමිණියා. බාබාට ඔවුන් පිළිගැනීමට සිදු වුණා. එවන් සරණ යාමක් සිදු වන්නේ එකම එක පරමාත්ම ජීවය පරමාත්ම පියා හා සමඟ පමණයි. ගුරුන් සරණ යන්නේ නැහැ. සරණක් සොයාගෙන පැමිණෙන්නේ විශාල වද වේදනා වලට ලක් වුණු විටයි. එවන් වද වේදනා වලට ලක් වන විට මිනිස්සු ගුරු කෙනෙකුගේ සරණ පතා යන්නේ නැහැ. එතනට යන්නේ තමන්ට සුදුසු වෙලාවකටයි. රාවණ ඔබව බොහෝ වද වේදනාවන්ට ලක් කරලා. රාමා පැමිණ සිටින්නේ රාවණව ඔබගෙන් නිදහස් කර ගැනීමටයි. ඔහු ඔබව තම සරණට ගන්නවා. ඔබ කියනවා: බාබා මා ඔබට අයිතියි. ඔබගේම පවුලේ අයත් සමඟ නිවසේ වාසය කරමින් සිටිය දීත් ඔබ බාබා සරණ ගිහින් සිටිනවා. බාබා, මම ඔබගේ උපදෙස්ම පමණක් පිළිපදින්නම්. පරමාත්ම පියා ශ්‍රීමත් දෙනවා. ඔබගේ පවුලේ අයත් සමඟ නිවසේ ජීවත් වන අතර මා සිහි කරන්න. අන් සෑම දෙයක්ම සිහි කිරීම නතර කර දමන්න. මා සිහි කිරීමෙන් පමණයි ඔබගේ පාප දුරු වන්නේ. එය සරණ යාම පිළිබඳ කරුණක්ම පමණක් නොවෙයි. සියල්ල රඳා පවතින්නේ සිහි කිරීම මතයි. පරමාත්ම පියා හැරෙන්න වෙන කිසිම කෙනෙකුට මෙලෙසින් පහදා දෙන්න බැහැ. මෙතරම් සිය දහස් ගණනක් පියා සමඟ සිටින්නේ කෙසේද කියා මිනිස්සු පුදුමයට පත් වෙනවා. පුරවැසියනුත් තම තමන්ගේ ගෙවල් වල තමයි ජීවත් වන්නේ: ඔවුන් රජ සමඟ වාසය කරන්නේ නැහැ. ඔබට කියා තිබෙන්නේ: ඒකායනය පමණක්ම සිහි කරන්න කියලයි. බාබා මම ඔබට අයිතියි. එක් තත්පරයකින් විමුක්තියේ උරුමය දානය කරන්නේ ඔබ පමණයි. ඔබ අපට රාජයෝගාව උගන්වා අපව රජවරුන්ගෙත් රජවරුන් බවට පත් කෙරෙව්වා. පරමාත්ම පියා කියනවා: මීට පෙර කල්පයේ දී තම උරුමය දිනා ගත්තන් නැවතත් පැමිණ එය ගනීවි. අවසානය තෙක් සෑම කෙනෙක්ම පැමිණ තම තමන්ගේ උරුමය පියාගෙන් දිනා ගත යුතුයි. දැනට ඔබ අපිරිසිඳු නිසා ඔබට දේවතාවරුන් කියා කියන්න බැහැ. පරමාත්ම පියා සියල්ල පැහැදිලි කර කියා දෙනවා. ඔහු කියනවා: මගේ දෑසේ මැණික ඔබ ස්වර්ණමය යුගයේ සිටිනා විට 1.1.1 දින සිට පාලනය ගෙන ගියා. සිය දහස් ගණනක ජනගහනයක් පැමිණි කළ තමයි අන් අයගේ රාජධානි ආරම්භ වන්නේ. ඔබට සටන් කිරීමේ

අවශ්‍යතාවයක් නැහැ. පරමාත්ම පියාගෙන් ඔබ තම උරුමය දිනා ගන්නේ යෝග බලයෙනි. නිහඬව සිටිමින් පරමාත්ම පියාවත් තම උරුමයත් සිහි කරන්න. අවසානයේදී ඔබ නිහඬ වේවි. මන්ද මේ පින්තූර ආදිය ඒ කාලයේදී වැදගත් වන්නේ නැහැ. ඔබ පඥාවන්ත වී සිටිනවා. පරමාත්ම පියා කියනවා: සරළවම මා සිහිකරන්න ඔබගේ පාප දුරු වී යාවි. දැන් මෙය කළත් නැතත් එය ඔබටමයි. කිසිම ශාරීරික කෙනෙකුගේ නමෙහි හෝ රූපයේ ගැලෙන්න එපා. පරමාත්ම පියාව සිහිකරන්න ඔබගේ අවසන් සිතිවිලි ගමනාන්තය තීරණය කරාවි. එවිට ඔබ මා ළඟට පැමිණේවි. ඉහළින්ම සමත් වන අය රාජ්‍යය දිනා ගනී. සියල්ල රඳා පවතින්නේ ස්මරණ වන්දනාව මතයි. තව දුරටත් ඉදිරියට යන අතර අලුත් අය රැසක් දිගටම ඉදිරියට යාවි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැතිවී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියා ගෙන් අධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිම ශාරීරික පුද්ගලයෙකුගේ නම හෝ රූපයේ පැටලෙන්න එපා. එකම එක පරමාත්ම පියාගේ ශ්‍රීමත් පිළිපැද විමුක්තිය ලබන්න. නිහඬව සිටින්න.
2. ඔබගේ අනාගත උපත් 21 සඳහා හොඳින් ඉගෙන ගෙන අන් අයටත් උගන්වන්න. ඉගෙන ගෙන අන් අයටත් ඉගැන්වීමෙන් පමණයි ඔබගේ නම කීර්තියට ලක් වන්නේ.

**වරදානය:** ශ්‍රීමත් වල පදනමට අනුව තමන්ගේ සහ අන් අයගේ උපදෙස් අවසන් කිරීමෙන් ඔබ කෝටි ගුණයක් භාග්‍යවන්ත වී, කෝටි ගුණයක ආදායමක් උපයා ගනිත්වා.

ශ්‍රීමත් පිලිපදින අයට තමන්ගේ හෝ අන් අයගේ උපදෙස් වලට අනුව එකදු සිතිවිල්ලක් වත් ඇති කළ නොහැක. ඔබගේ මනෝ ස්ථිතිය ශක්තිමත් නැත්නම්, අනිවාර්යෙන්ම තමන්ගේ හෝ අන් අයගේ උපදෙස් ශ්‍රීමත් සමග මිශ්‍ර වී ඇති. මනසේ උපදෙස් යනු, ජීවාත්මයකගේ සීමිත සංස්කාර වලට අනුව පැන නැග, ඉන්පසුව එම ජීවාත්මය චංචල කරන සිතිවිලිය. එබැවින් තමන්ව පරීක්ෂා කරන්න, එසේ නැත්නම් අන් අය ලවා තමන්ව පරීක්ෂා කරවා ගන්න. ශ්‍රීමත් නොමැතිව එකදු පියවරක් වත් නොගන්න, මන්ද ඔබට කෝටි ගුණයක ආදායමක් උපයාගෙන, කෝටි ගුණයක් භාග්‍යවන්ත වීමට හැකි වන්නේ එවිට පමණයි.

**පාඨය:** ලොවට සෙත සලසන ජීවාත්මයකගේ යුතුකම වන්නේ නිරන්තරයෙන් සියළු දෙනා කෙරෙහි ඔබගේ මනසේ හිතකාමී හැඟීම් තිබීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැදී සිටින්න.**

සිදුවීම් කෙබඳු වුනත්, බුද්ධියේ විශ්වාසය ඇති දරුවන්, ඔවුන්ගේ ආදිතම ස්ථිතියේ බලය තුලින් තමන් නිරන්තරයෙන් ජයග්‍රාහී බව අත්විදියි; ඔබ පරාජය වී ඇති බව ලෝකයේ මිනිසුන් හෝ බ්‍රහ්මින් පවුල සමග නෑ සබඳතාවයක් ඇති අය සිතුවත් පැවසුවත්, එම පරාජය, පරාජයක් නොව ජයග්‍රහණයකි. සේවයේ, සමූහයක හෝ පදාර්ථ වල ඕනෑම සිදුවීමක් ඔබගේ ආදිතම උසස් මනෝස්ථිතිය චංචල කරන්නේ නම්, එය බන්දන වලින් නිදහස් ස්ථිතිය නොවෙයි. මෙම බන්දනයෙන් පවා නිදහස් වන්න.